''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 2394-6792**
**http://fhss.sjp.ac.lk/pumithiri-journal/**
**වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 19-26**

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ශිෂ්‍ය දේශපාලනය

**නිෂාදි තාරකා මාරසිංහ**
රුහුණ විශ්වවිද්‍යාලය
nishadimarasinghe1995@gmail.com

**සංක්ෂේපය**
හෙළ සිංහල සංස්කෘතියේ බර දරන්නිය කාන්තාවක් වූ කළ සමාජ සංස්කෘතික සාරධර්ම හා සභ්‍යත්වය ආරක්ෂා කිරීමේ වගකීම කාන්තාවකට පැවරේ. අතීතයේ සිට ආගමික හා සංස්කෘතික සීමාවන්ට කොටු වූ ස්ත්‍රීත්වයේ කාර්යභාරය පවුල වෙතම බැඳ තැබිණි. එහෙත් 1980 දශකයේ ඇති වූ දේශපාලනික, ආර්ථික, සමාජීය සාධකයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රියගේ සමාජගමනය සිදු විය. ඒ අනුව කාන්තාව යනු සමාජය තුළ සක්‍රීය විය යුතු ජීවියෙකි. ලාංකික දේශපාලන සංස්ථාව තුළ පුද්ගල ක්‍රියාකාරීත්වය හමුවේ සක්‍රීය විය යුතු ස්ත්‍රීත්වයට ස්ත්‍රී පුරුෂ සමාජානුයෝජනයේ බලපෑමක් දක්නට ලැබෙන්නේ ද? එසේ දක්නට නොලැබෙන්නේ නම් සක්‍රීය දේශපාලනය තුළ කාන්තා දායකත්වය අඩුව ඇත්තේ ඇයි?. මෙම කාරණාව අධ්‍යයන කිරීම සඳහා භාජනය කර ගනු ලබන පර්යේෂණ ගැටලුව නම් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනයට ශිෂ්‍යයාවගේ සහාගීත්වය අවම ව ඇත්තේ ඇයි? යන ප්‍රස්තුතයයි. එය නූතන විශ්වවිද්‍යාල පද්ධතිය පදනම්කර ගනිමින් පර්යේෂණයට ලක් කරන අතර විශ්ව විද්‍යාලය තුළ ස්ත්‍රී භූමිකාව වෙත අවධානය යොමු කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එය සනාථ කරගැනීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත පදනම් කරගත් මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කරන ලදි. නාගරිකව පවතින විශ්වවිද්‍යාල හා ග්‍රාමීයව පවතින විශ්වවිද්‍යාල කේන්ද්‍රකරගනිමින් ශිෂ්‍යයාවන් 80 දෙනෙක් සහ ශිෂ්‍යයන් 20 දෙනෙක් මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදි. ආසියානු කාන්තාව තුළ දක්නට ලැබෙන ස්ත්‍රීවාදී ආකල්ප තවමත් අනාගත පරම්පරාව වෙත සම්ප්‍රේෂණ වී ඇති ආකාරය දැකගත හැකිය. සමස්තයක් ලෙස නොව බහුතරයකගේ අදහස ශිෂ්‍ය සංගම් තුළ ශිෂ්‍යාවගේ කාර්යභාරය අවම ව ඇති බවයි. සරසවි සිසුවිය තමන් තුළම නිර්මාණය කරගන්නා ආකල්ප පදනම් කරගනිමින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනයෙන් ඈත්ව සිටී. බුද්ධිමතුන්ගේ පාරාදීසය සරසවියයි. එහිදී තරුණ කාන්තා හඬ වියැකී ගියහොත් රටේ අනාගත කාන්තා නායකත්වයට කුමක් සිදුවේද? මේ සියල්ලටම පදනම් වී ඇත්තේ සමාජ ප්‍රතිමානයි.

**මුඛ්‍ය පද:** ශිෂ්‍යයාව, ස්ත්‍රීවාදය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ ප්‍රතිමාන, දේශපාලනය සහභාගීත්වය

## හැඳින්වීම

ස්ත්‍රියක් වූ පමණින් සමාජයෙන් කොන්ව පළා යා යුතුද? අයිතිවාසිකම් ඉල්ලා පොර බදින ස්ත්‍රීත්වය හමුවේ ස්ත්‍රීත්වය තව තවත් හිඟමන් යදිනතෙක් බලා සිටිනවාද? පිරිමියෙකුට හිමි වරප්‍රසාද හා අයිතිවාසිකම් ස්ත්‍රියකට උරුම නොවන්නේ නම් එලෙස උරුම නොවන්නේ ස්ත්‍රියක් ව නිසා ඉපදීම නිසාද? සියල්ලටම පිළිතුර සමාජය ඉදිරියේම පවතී. පිරිමි ළමයෙකු කරන කාර්යයන් ගැහැණියක් අතින් සිදු වන විට ඕවා පිරිමි කරන වැඩ යනුවෙන් පැවසීම සමාජයේ සාමාන්‍ය සිරිතයි. ගැහැණියකගේ වැඩ යනුවෙන් සම්මත ක්‍රියාවන් පිරිමින් අතින් සිදු වුවහොත් එයට දොස් ඇසීමට සිදුවන්නේ ද ගැහැණියකටමයි. මේ නිසාම සාම්ප්‍රදායික පොදු ජන සමාජයේ ගැහැණු වැඩ, පිරිමි වැඩ යනුවෙන් සමාජයේ වැඩ බෙදා හැර ඇත. මෙනිසාම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම තම ස්ත්‍රී පුරුෂභාවය මත තීන්දු තීරණවලට පැමිණීම දැක ගත හැකිය.

තව ද ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග යන ජීව විද්‍යාත්මක වෙනස මත පදනම්ව සමාජය විසින් දීර්ඝකාලීන ව නිර්මාණය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජාවය මත පදනම් වූ සමාජ තත්ත්වයන් පවතී. එනම් රැකියා, පවුල තුළ රඟ දැක්ය යුතු භූමිකා, සමාජ භූමිකා, ගති පැවතුම්, හැසිරීම් රටා හා අනන්‍යතාවයන් පවා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් ව බෙදා වෙන් කර ඇති බව දැකිය හැකිය. එපමණක් නොව පුරුෂයින් කායික මෙන් ම මානසික වශයෙන් ශක්තිමත් වූ ද කාන්තාවන් සාපේක්ෂව එඩිතර වූ ද බුද්ධිමත් හා තාර්කික වූ ද

නායකත්ව ගුණාංග සහිත වූ ද කොටසක් ලෙස හඳුනා ගන්නා සමාජය කාන්තාව යනු පුරුෂයෙකු මත යැපෙන, කාරුණික හා පවුල මූලික කර ගත් පිරිසක් ලෙස ලේබල් ගත කරයි. ඉහත සමාජය වසින් නිර්මාණය කරන ලද අනන්‍යතාව ස්ත්‍රී මෙන්ම පුරුෂ යන දෙපාර්ශවය විසින්ම අවුරුදු දෙක පමණ වන විට ස්ථාපිත කර ගන්නා අතර සමාජානුයෝජන ක්‍රියාවලිය හරහා තවදුරටත් අභ්‍යන්තරීකරණය කරගැනීම සිදු කරයි. (ලියනගේ සහ වළාකුළුගේ, 2006)

ආගමික සංස්කෘතික හර පද්ධතීන්ගෙන් බැඳුණු කාන්තා භූමිකාව සමාජයට නිරාවරණය වන්නේ කාලීන විකාශනය සමගයි. ගැහැණියක් යනු මෘදු මොළොක් ගතිගුණ ඇති ඇත්තියකි. ඇය ස්වකීය වේදනාව පහ කරනු ලැබුවේ කඳුළ හරහාය. මේ නිසාම ඇඬීම යන ලක්ෂණය කාන්තාවට පමණක් අදාළ පිරිමියෙකු විසින් නොකළ යුතු දෙයක් ලෙස සමාජයේ ආරෝපණය වී ඇත. සමාජය විසින් ගොඩනගා ඇති "ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාව" ලෙස හැඳින්වෙන්නේ මෙය යි. ඇඬීම කාන්තාවන්ට පමණක් උරුම වූ දෙයක් යන්නට ජීව විද්‍යාත්මක සාක්ෂි කිසිවක් නොමැත්තේ ගැහැණු පිරිමි සියල්ලන්ටම කඳුළ පොදු වූ නිසාවෙනි. එසේ වුවද, සමාජය විසින් ගොඩනගා ඇති සමාජ ප්‍රතිමානයන්ට අනුව ඇඬීම කාන්තාවන්ට ආවේණික දෙයක් ලෙස සමාජගත කර ඇත.

1980 ගණන්වල දී ඇති වූ දේශපාලනික, සමාජීය සහ ආර්ථික සාධකයන්හි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් සම්බන්ධයෙන් වූ මෙම සාම්ප්‍රදායික මතවාදය වෙනස් වීමට පටන් ගැනුණි. 1980 වකවානුවේදී සහ ඊට පූර්ව කාලයේ දී සිදුවූ ආයුධ සන්නද්ධ කලකෝලාහලයන් හි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ තරුණ පිරිස් ඝාතනය කෙරුණු අතර බොහෝ පිරිස් අතුරුදහන් කෙරුණි. ආයුධ සන්නද්ධ කලකෝලාහලයන්හි ප්‍රතිඵල කාන්තාවන් කෙරෙහි විශාල බලපෑම් එල්ල කරන ලදී. ඉන් අනතුරුව කාන්තාවන්ගේ සමාජීය සහ දේශපාලනික මැදිහත්වීම වර්ධනයවීමට පටන් ගැනුණි. කාන්තාවන් තමන්ට සිදුවූ අසාධාරණයන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා සටන් කිරීම සඳහා බොහෝ සංවිධාන පිහිටුවීමට පටන් ගත්හ. එලෙස ප්‍රථමයෙන් පිහිටුවාගත් එවන් වැදගත්කමකින් යුත් කාන්තා පිබිදීම් ව්‍යාපාරය වශයෙන් 1982 වසරේදී පිහිටුවන ලද කාන්තා ක්‍රියාකාරී කමිටුව පෙන්වා දිය හැකිය. ඉන් අනතුරුව ප්‍රාදේශීය හා ජාතික තලයන්හි කාන්තා නායකත්වයන් යටතේ බොහෝ ව්‍යාපාර ආරම්භ විය. එසේම, 1970 වකවානුවේදී ආර්ථික ව්‍යුහය ගොඩනැගීමේ අරමුණින් එක්සත් ජාතික පක්ෂය විසින් හඳුන්වා දෙන ලද නිදහස් වෙළඳ කලාප, ඇඟලුම් කර්මාන්ත ශාලා යනාදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන් විසින් ආර්ථිකයට දෙනු ලබන දායකත්වය වර්ධනය විය. 1970 සහ 1980 වකවානුවන්හි දී සිදුවූ මෙවන් ආර්ථික, සමාජීය සහ දේශපාලනික වෙනස්කම් මත කාන්තාවෝ තම සාම්ප්‍රදායික කාර්යභාරයන්ට ඔබ්බෙන් පොදු ජීවිතයට දායකවීමට පටන් ගත්හ. කෙසේ නමුත්, කාන්තාවන් පිළිබඳව පැවති සාම්ප්‍රදායික මතවාදයන් මුළුමනින්ම වෙනස් නොවූ අතර ඒවා මේ වන විට ද ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කරයි (ශිවකුමාර්, 2021).

1960 වසරේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රටේ අග්‍රාමාත්‍යවරිය වශයෙන් තෝරා පත්කර ගැනී. මේ ප්‍රතිඵලයක් වශයෙන් ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය බිහි කළ රට යන අභිමානය ශ්‍රී ලංකාව අත්කර ගත්තේය. එසේම, 1931 වසරේ දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඔස්සේ වයස අවුරුදු විසි එක (21) ඉක්මවූ කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආසියානු හා අප්‍රිකානු මහද්වීපය තුළ කාන්තාවන් සඳහා ඡන්ද අයිතිය මුල් කාලීනවම ලබා ගන්නා ලද රටවල් අතරින් ශ්‍රී ලංකාව ද එක් රටක් වශයෙන් එම අභිමානය ද අත්කර ගත්තේය (Jayawardena,2016).

මෙලෙස, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ලංකාවේ පිළිගනු ලැබෙන සහ අගයකරනු ලබන සංකල්පයක් ව පැවතියත් වර්තමානය වන විට එම ලක්ෂණ දක්නට නොලැබෙන්නේ ස්ත්‍රියගේ දේශපාලනය සක්‍රීය මට්ටමක නොමැති වීමයි. මෙකී සමාජ ස්වරූප සැම තැනකදීම අප නෙත ගැටේ. උක්ත පර්යේෂණය හරහා අවධානය යොමු කරන්නේ ද එවැනිම වූ ගැටලුවක් වෙතයි. විශ්වවිද්‍යාලය ශිෂ්‍යයා යනු වර්තමානයේ කතාබහට ලක් වූ සුවිශේෂී මාතෘකාවකි. තම ඉල්ලීම් අයිතිවාසිකම් වෙනුවෙන් තම හඬ අවදි කරවන සක්‍රීය ජීවී කොට්ඨාසයක් වන සරසවි සිසුවා සමාජ බලපෑම් කණ්ඩායමක් ලෙස සමාජීය, ආර්ථික, දේශපාලනික ගැටලුකාරී තත්ත්වයන්ට විසඳුම් සොයායන පිරිසකි. නමුත් අවාසනාවකට අද වන විට ශිෂ්‍ය දේශපාලනය තුළ විශ්වවිද්‍යාල සිසුවියගේ දායකත්වය අවම මට්ටමක පවතී. විශ්ව විද්‍යාලය යනු සිසුන්ගේ අවශ්‍යතාවන්

වෙනුවෙන් ක්‍රියාමාර්ග ගනු ලබන සමාජානුයෝජන ක්‍රියාවලිය සාර්ථකව සිදු කරනු ලන ආයතනයකි. නමුත් දීර්ඝ කාලීනව ශිෂ්‍යාවගේ භූමිකාව ඇතට ගියහොත් සක්‍රීය දේශපාලනයේ උගත් කාන්තා දේශපාලන සහභාගීත්වය තව තවත් අවම වනු ඇත. මෙම පර්යේෂණය හරහා අවධානය යොමු කරන්නේ සක්‍රීය දේශපාලන ක්‍රියාදාමයට බලපාන සමාජ ප්‍රතිමාන හඳුනා ගැනීමටයි.

**සාහිත්‍ය විමර්ශනය**

උක්ත පර්යේෂණ ගැටලුව පිළිබඳව අවධානය යොමු කිරීමේ දී කරන ලද සාහිත්‍ය විමර්ශනවලදී අනාවරණය වූයේ ශිෂ්‍ය දේශපාලන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජ ප්‍රතිමාන ඍජුව දායක වන බවයි. ඒ හේතුවෙන් පුද්ගලයා ලබන අත්දැකීම් සහ පවුල් පරිසරය මත ශිෂ්‍යයාවන් තීන්දු තීරණ ගනු ලබයි. දේශපාලන සමාජානුයෝජනය විධිමත් සහ අවිධිමත්ව පුද්ගලයෙකු ලබයි. ඒ මත ගොඩ නැගෙන දේශපාලන සහගීත්වය නිසා පුද්ගලයන් දේශපාලන ක්‍රියාවලිය වෙත දක්වන ප්‍රතිචාර දක්වයි. එකී විධිමත් හා අවිධිමත් දැනීම වටා ශිෂ්‍යයන් කේන්ද්‍රගත වෙමින් ක්‍රියාකළ ආකාරය හා ඒවාට හේතු වූ කාරණා සොයා බැලීම මෙම අධ්‍යයනයේ දී සිදුකරන ලදි.

ප්‍රදීප් (2003) අනුව ග්‍රාමීය සමාජවාදයේ දේශපාලනය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයේ දී ශිෂ්‍ය දේශපාලනය තුළ බලය ගොඩ නගා ගන්නා ආකාරය පිළිබඳව විශ්ලේෂණය කරයි. මෙමගින් මූලික තර්ක ගණනාවක් සම්බන්ධව අවධානය යොමු කෙරේ. ශිෂ්‍ය දේශපාලනයට ජනතා විමුක්ති පෙරමුණ කළ බලපෑම, ශිෂ්‍ය දේශපාලනයේ මූලික අභිමතාර්ථ හා හැකියාවන්, ශිෂ්‍ය බලය ගොඩ නැගීමට යොදා ගැනෙන සාධක හා ශිෂ්‍ය දේශපාලනය නිසා ඇති වන අර්බුධකාරී වාතාවරණය සම්බන්ධයෙන් මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරේ. මොහුගේ කෘතිය තුළ දී ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල කේන්ද්‍ර කර ගනිමින් ශිෂ්‍ය සංගම් යොදාගෙන තම බලය ජාතික දේශපාලනය තුළ ස්ථාපිත කිරීමට උපක්‍රමශීලීව ක්‍රියාකළ ආකාරය පෙන්වා දෙයි. ශිෂ්‍ය දේශපාලනයේ අරමුණු වාමාංශික පක්ෂවල අරමුණු බවට පත් කරමින් ක්‍රියා කිරීමට ගත් උත්සාහය මෙම කෘතිය තුළ දැක්වේ. මෙකී කාලීන වෙනස්කම් පදනම් කර ගනිමින් ශිෂ්‍ය දේශපාලනයේ ගමන් මග වෙනස් වූ බව මේ හරහා පැහැදිලි වේ. උක්ත පර්යේෂණයේ දී ශිෂ්‍ය දේශපාලනය ගැන අවධානය යොමු කළත් ශිෂ්‍යයාව පිළිබඳ අවධානය යොමු කර නොමැත. නමුත් එකල ශිෂ්‍ය දේශපාලනයේ අඳුරු සෙවණැලි අදටත් වත්මන් ශිෂ්‍ය ශිෂ්‍යයාව වෙළාගෙන අවසන්ය. එනිසාම තවමත් ශිෂ්‍ය දේශපාලනය දේශපාලන අතකොලු ලෙස බොහෝ දෙනෙක් දකී.

වික්‍රමරත්න (2006) අනුව ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය නමින් රචනා වී ඇති කෘතිය තුළ මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ව්‍යාපාරයේ ඓතිහාසික පසුබිම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ව්‍යාප්තිය, ශ්‍රී ලාංකික ශිෂ්‍ය අරගලයේ ස්වභාවය මෙන්ම ජාත්‍යන්තර ශිෂ්‍ය අරගලයේ ස්වභාවය වෙත ද අවධානය යොමු කර ඇත. 1983 කළු ජූලියෙන් පසු ශිෂ්‍ය අරගලය ඉදිරි පියවරයන් තබන ආකාරයත් 1960 සිට 2006 දක්වා අන්තර් විශ්වවිද්‍යාල බලමණ්ඩලයේ කැඳවුම්කරුවන් පිළිබඳ තොරතුරු ද අනාවරණය වේ. එහෙත් ඒ දක්වා කාල සීමාව තුළ ද කාන්තාවකගේ නායකත්වයක් දක්නට නොමැත. ශිෂ්‍ය දේශපාලනයට උරදුන් සිසුන්ගේ ඝාතනයන් පිළිබඳව මෙහි දැක්වේ. මෙවැනි ගමන් මගක පැමිණි ශිෂ්‍ය සංගම් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අප්‍රසාදයක් පවතින්නේ ද ඒ තුළින් රටට අහිමි බුද්ධිමතුන් සංඛ්‍යාව අති බහුතරයක් වීඇති නිසාවෙනි.

විශ්වවිද්‍යාලය තුළ සිටින සියලුම ශිෂ්‍යාවන් ශිෂ්‍ය දේශපාලනයට නතු වී ඇති බව කිව නොහැකිය. මන්දයත් මේ හා සම්බන්ධ වනුයේ කොටසක් පමණි. එනම් තම පවුල් පසුබිමේ ස්වරූපය මත නැතිනම් තම ස්වාධීන කැමැත්ත මත විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන රැඩිකල්වාදී ස්වරූපයේ ස්වභාවයට කැමැත්ත මත ආදී වශයෙන් විවිධ කාරණා ඔස්සේ ශිෂ්‍යයාවන් දේශපාලන කාර්යයන්ට සම්බන්ධ වනු බලයි. එහෙත් මේ හා සම්බන්ධ දේශපාලන කාර්යයන්ට ඉතා අවම වශයෙන් ශිෂ්‍යාවන් යම් පමණකින් සම්බන්ධ වනු ලබයි. නමුත් අරගලකාරී තත්ත්වයන් තුළ ශිෂ්‍යයාවන් යම් පමණකින් සම්බන්ධ වන ආකාරය පෙන්වා දිය හැකිය (තෙල් බැම්මෙන් ඔබ්බට, 2002).

ශිෂ්‍ය දේශපාලනයට ශිෂ්‍යාවගේ ආගමනය පිළිබඳ තොරතුරු විමසා බැලීමේ දී විරු සිසුවියන් පිළිබඳ අතීත මතක එකතු කළ හැකිය. නමුත් වර්තමාන ශිෂ්‍යයාව ශිෂ්‍ය දේශපාලනය තුළින් ඈත්ව කටයුතු කරන්නේ සමාජ ප්‍රතිමාන හා සමාජ ආකල්ප සිත්හි තබාගෙනයි.

යම් සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ භූමිකාවන් ඔවුන්ගේ ලිංගිකත්වය, ආගම, සංස්කෘතිය යනාදිය පදනම් කරගෙන අර්ථ නිරූපණය කරන සහ සමාජයේ බල සම්බන්ධතා නැතහොත් බල ගතිකයන් කුමන ආකාරයට පැවතිය යුතු ද යන්න නිර්වචනය කරන "රීතීන්" හෝ "ආචාරධර්ම" හෝ "හැසිරීම් රටා" හෝ "සම්ප්‍රදායන්" සමාජ ප්‍රතිමාන ලෙස හැඳින්වේ (UNDP, 2020).

සමාජ ප්‍රතිමාන (social norms) යන යෙදුම සඳහා තනි නිර්වචනයක් ලබාදීම අපහසු කාර්යයකි. සමාජ ප්‍රතිමාන, විවිධ සමාජයන්හි පවතින වෙනස් වූ වාතාවරණයන්ට අනුව විවිධ වූ ස්වරූපයන්ගෙන් ස්ථාපිතව පවතී. 2019 වසරේ දී ඕහෘජ ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණය මගින්, සමාජ ප්‍රතිමාන 'සංස්කෘතික මූලිකාංග, 'සංස්කෘතික මූලධර්ම', 'ආගමික විශ්වාසයනී නැතහොත් 'පාරම්පරික පුරුදු පුහුණු නැතහොත් සම්ප්‍රදායන් ලෙසී ස්ථාපිතව පැවතිය හැකි බවත් විශේෂයෙන්ම, ඒවා අනන්‍යතාවන් හා බද්ධව පවතින බවත් පෙන්නුම් කරයි (UNDP, 2019).

සමාජ ප්‍රතිමාන සාමාන්‍යයෙන් ලිංගිකත්ව පදනමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් අර්ථ නිරූපණය කළද සමාජ ප්‍රතිමාන විසින් අර්ථ නිරූපණය කෙරෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ භූමිකාවන් වලට අනුගතව ක්‍රියාකළ යුතු බවට පුරුෂයින්ට බලපෑම් නොකෙරෙන නමුත් කාන්තාවන් සම්බන්ධයෙන් ගත්කල ඔවුන් එවැනි සමාජභාවය මත පදනම් වූ භූමිකාවන්ට අනුගත වීම සමාජයෙහි නොසලකා හැරීමට ලක්කළ නොහැකි අනිවාර්ය රීතියක් බවට පත්කොට ඇත (Butt & Sharanya, 2019). කාන්තාවන් සමාජ ප්‍රතිමානයන්ගෙන් අපගමනය වීම වැළැක්වීම සඳහා සමාජය තුළ කාන්තාවන් සඳහා විවිධ පාලනයන් පනවා තිබේ. කෙසේ නමුත්, එවැනි පාලනයන් පුරුෂයන් සම්බන්ධයෙන් දක්නට නොමැත (Vithanage, 2015)

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශලපාලනය තුළ ශිෂ්‍යයාවගේ සහභාගීත්වය හා නායකත්වය අවම වීමට බලපා ඇති හේතු සාධක හඳුනා ගැනීමයි. එහිදි ප්‍රාථමික හා ද්විතීක දත්ත මිශ්‍ර ක්‍රමවේදයක් යොදා ගන්නා ලදී. එහිදි ද්වීතික මූලාශ්‍ර ලෙස ප්‍රකාශිත හා අප්‍රකාශිත පොත්පත්, සඟරා, පුවත්පත් ලිපි මෙන්ම වාර්තාවන් මේ සඳහා යොදා ගන්නා ලදි. ප්‍රාථමික දත්ත ලෙස විශ්වවිද්‍යාල තුනක තොරතුරු භාවිතා කරන ලදි. ඒ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවලින් ශිෂ්‍යයාවන් 80 ක් තෝරාගෙන ශිෂ්‍යයන් 20 දෙනෙක් ද අහඹු නියැදිය යටතේ තෝරා ගන්නා ලදි. ප්‍රශ්නාවලි ක්‍රමයත්, සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා නිරීක්ෂණ ක්‍රමය මගින් පර්යේෂණ ක්‍රමයට බඳුන් කර ප්‍රාථමික දත්ත රැස්කර ගන්නා ලදි. මෙම අධ්‍යයනයට යොදා ගන්නා ලද දත්ත ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරන අතර ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රමය ඔස්සේ ද ගුණාත්මක දත්ත උද්ගාමී ප්‍රවේශය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදි.


**ප්‍රතිඵල සාකච්ඡාව**

ලාංකික ශිෂ්‍ය දේශපාලනය තුළ ශිෂ්‍යයාවන් ශිෂ්‍ය දේශපාලනයට මුහුණ දීමේදී යම් යම් අභියෝග සහ සීමාවන්ට ලක්වේ. එමෙන්ම විශ්වවිද්‍යාල සිසුවිය තුළ ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් විවිධ අදහස් ද පවතී. මෙම පර්යේෂණය හරහා එම කාරණා පිළිබඳ අවධානය යොමු කරන අතර ශිෂ්‍යයාවන් ශිෂ්‍ය දේශපාලනයට අවම වශයෙන් දායක වීමට බලපානු ලබන සාධක වෙත අවධානය යොමු කරයි.

**ශිෂ්‍ය දේශපාලන සහභාගීත්වය පිළිබඳ ප්‍රතිචාරී ආකල්පය**

මෙම පර්යේෂණය සඳහා යොදාගන්නා ලද සමස්ත නියැදියෙන් බහුතරයකට ශිෂ්‍ය දේශපාලනය පිළිබඳ දැනුවත්භාවයක් පැවතිය ද ශිෂ්‍යයාවන්ගේ ක්‍රියාකාරීත්වය අවම මට්ටමක දක්නට ලැබිණි. එයට බොහෝ සේ හේතු වී ඇත්තේ 88-89 කාලය තුළ දේශපාලන ගමන් මගෙන් සරසවි සිසුවාට එල්ල වූ ප්‍රබල ප්‍රහාරයයි. ශිෂ්‍යයන් තුළ ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් දැඩි ආකර්ශනයක් පවතී. විශ්වවිද්‍යාලයට පැමිණි දා සිට ඔවුන්ව සමාජානුයෝජනය කරන්නේ ශිෂ්‍ය සංගම් හා ශිෂ්‍ය නායකත්වය හරහාය. මේ නිසා ශිෂ්‍ය ශිෂ්‍යයාවන් බහුතරයක් ශිෂ්‍ය සංගම් වටා ආකර්ෂණය වෙමින් පවතී. මෙහිදි ශිෂ්‍යයාවන් තුළ ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් අවම දැනුවත් භාවයක් 34% පැවති අතර ශිෂ්‍යයාවන් 41%දෙනෙකුට මේ පිළිබඳ සාමාන්‍ය දැනුමක් පැවතිණි. ඒ අතර 25% ප්‍රමාණයකට ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් විධිමත් දැනීමක් පැවතිණි.

රූප සටහන 1: ශිෂ්‍ය දේශපාලන සහභාගීත්වය පිළිබඳ දැනුවත්භාවය




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය. 2023*

එසේම තමන් තුළ ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් පවතින දැනුම තමන් වෙත ලැබුණු ආකාරය පිළිබඳව ද අප මෙහිදි විමර්ශනයට ලක් කළේය. එහිදි ජනමාධ්‍ය, නවක නම්නීකරණ වැඩසටහන්, සමාජ මාධ්‍ය, සමවයස් කණ්ඩායම් සහ සමාජය හරහා ඔවුන් මේ පිළිබඳ යම් දැනීමක් ලබා තිබිණි. නමුත් එම දැනීම විධිමත් දැනීමක් ලෙස හඳුනාගත නොහැකිය. මෙහිදි ඇතැම් සිසුන් සරසවි වෙත පැමිණෙන්නේ කොවිඩ් වසංගතය සමඟයි. මේ නිසා විශ්වවිද්‍යාල උපසංස්කෘතිය පිළිබඳ දැනීමක් ඔවුන් තුළ විශ්වවිද්‍යාල ක්‍රියාවලියෙන් ඔවුන් යම්තාක් දුරකට ඈත්ව සිටීමට උත්සාහ කරන්නේ එය කාලය නාස්ති කර දැමීමක් ලෙස සලකමිනි. එනිසාම ශිෂ්‍ය දේශපාලනය පිළිබඳ නිසි දැනුමක් මොවුන් තුළ රෝපණය කළ යුතුය. ජාතික දේශපාලනය හා ශිෂ්‍ය දේශපාලනය අතර වෙනස වටහා දිය යුතුය. එසේ නොමැති වුවහොත් උගත් බුද්ධිමත් දේශපාලන ජීවියෙකුට හඬ නගන්නට ඇති පූර්ව වේදිකාව අහිමි වී යනු ඇත.

“අපිට අපි ඉල්ලීම් ගැන පාලකයන්ට කියන්න අපේ දේවල් ලබා ගන්න තියෙන එකම ආයුධය ශිෂ්‍ය දේශපාලනය. අපි කොච්චර ඉල්ලුවත් දෙන්නේ නෑ පාරට බහිනකල්”
(ප්‍රතිචාරී අදහස් අංක 02 - නියැදි සමීක්ෂණය, 2023)

“ඕවට ගිහින් නිකන් සස්පෙන්ඩ් වෙන්න බෑ. මොකද අපි ගැනු ළමයි.”
(ප්‍රතිචාරී අදහස් අංක 03 - නියැදි සමීක්ෂණය, 2023)

ශිෂ්‍ය දේශපාලනය සම්බන්ධයෙන් විවිධ ධනාත්මක හා ඍණාත්මක අදහස් මේ හරහා මතු වීම සිදුවිය. ඇතැම් සිසුන් ශිෂ්‍ය දේශපාලනය ගැන කතා කරනු ලැබුවේ අතීත සිද්ධි දාමයන් පදනම් කරගෙනයි. තරුණ කැරළි හා දේශපාලන සිදුවීම් සිහිපත් කරමිනි. “විරු සිසුවන් රැකගත්ත නිදහස් අධ්‍යාපනයත් අපිව පාගන්න උත්සාහ කරන ජඩ දේශපාලනයත් නිසා කොච්චර තරුණ ජීවිත 88-89 කාලයේ විනාශ වෙන්න ඇත්ද?” (ප්‍රතිචාරී අදහස් අංක 04)

**ශිෂ්‍යයාව ශිෂ්‍ය දේශපාලනය තුළ සක්‍රීයව ක්‍රියාත්මක වීම පිළිබඳ ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාරී ආකල්ප**

ශිෂ්‍යයාවගේ දේශපාලන දායකත්වය පිළිඳව ශිෂ්‍යයන්ගෙන් විමසා බැලීම අපේක්ෂා කළ හෙයින් මෙම අධ්‍යයනය සඳහා ශිෂ්‍යයන්ගේ අදහස් ද යොදාගන්නා ලදි. සමස්ත නියැදියෙන් හුතරයකගේ අදහස වූයේ ශිෂ්‍යයාවන්ගෙන් 80% ම ශිෂ්‍ය සංගම්වල කාර්යයන්ට දායක නොවන බවයි.

“ඇත්තටම ලොකු අඩුවක් කෙල්ලෝ වැඩ කරන්න එන්නේ නැති එක. ඒගොල්ලොන්ගේ දායකත්වය මීට වඩා ලැබුණා නම් අපිට ඉස්සරහට ලොකු වැඩක් කරන්න පුළුවන්. කෙල්ලෙක් වුණාම එක එක ප්‍රශ්න තියෙනවා තමයි. ඒත් විම් නැති ප්‍රශ්න නෑනේ”.
(ප්‍රතිචාරී අදහස් අංක 03 - නියැදි සමීක්ෂණය, 2023)


“මට හිතෙන විදියට පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය අඩුවෙන්නත් මේවා හේතු වෙනවා ඇති සමාජයක උගත් බුද්ධිමතුන් විදියට වෙනස් විය යුතු තැන් වෙනස් කරන්න කාන්තා ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටින්න කාන්තාවන් ඕන. ඒත් දිගින් දිගටම මෙහෙම වුණොත් රට පිරිමින්ටම විතරක් පාලනය කරන්න වෙයි ගල් යුගේ වගේ”.
(ප්‍රතිචාරී අදහස් අංක 03 - නියැදි සමීක්ෂණය, 2023)

**ශිෂ්‍යයාවගේ දේශපාලන ගමන් මඟට බලපෑම් එල්ල කරනු ලබන සාධක පිළිබඳ ප්‍රතිචාරී ආකල්පය**

සමස්ත නියැදියෙන් බහුතරයකගේ අදහස වන්නේ ශිෂ්‍යයාවක් ශිෂ්‍ය දේශපාලනයට සම්බන්ධ නොවන්නේ තම පවුල තුළින් එල්ල කෙරෙන බලපෑම් නිසා බවයි. විශ්වවිද්‍යාල වරම් හිමි කරගන්නා ශිෂ්‍යයාවන්ගෙන් බහුතරයක් නිර්ධන ප්‍රාන්තික පවුල්වලට අයත් අයයි. 1988- 1989 යන වර්ෂවල විශ්වවිද්‍යාල තරුණයන්ට හා තරුණියන්ට මුහුණ දීමට සිදු වූ අත්දැකීම් පාදක කරගනිමින්

දැඩි බියකින් කටයුතු කරන ආකාරයක් සිසුවියන් තුළ දැකගත හැකිවිය.

රූප සටහන 2: ශිෂ්‍යයාවගේ දේශපාලන ගමන් මඟට බලපෑම් එල්ල කරනු ලබන සාධක




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය. 2023*

"මම ඉස්සෙල්ලාම කැම්පස් එන දවසේ අප්පච්චි කිව්වේ ඔය දේශපාලන වැඩ වලට එහෙම යන්න එපා කියලා"
(ප්‍රතිචාරී අදහස් අංක 03 - නියැදි සමීක්ෂණය, 2023)

පිරිමියා බොහො විට ජවසම්පන්නය. ශිෂ්‍ය සංගම් සමිතිවාර,රැස්වීම් හා සරසවියේ බාහිර කටයුතු සඳහා දිවා නොබලා සහභාගි වෙන්නට මොවුන්ට හැකියාව පවතී. නමුත් ශිෂ්‍යාවන්ට එසේ නොවේ රෑ වෙත්ම නිවසෙන් සහ නේවාසිකාගාරවලින් ගැටලු මතුවේ. ඒ බව මොවුන්ගේ අදහස්වලින් පැහැදිලිය.

"අපි රෑ 8 ට කලින් හොස්ටල් එකට යන්න ඕන. හැමදාම රෑ වෙලා එනකොට එකේ ඉන්න අය හිතන්නේ වෙනම දෙයක්. ඒ හින්දා ගොඩක් වෙලාවට මේවයින් ඈත්වෙලා ඉන්නවා"
(ප්‍රතිචාරී අදහස් අංක 03 - නියැදි සමීක්ෂණය, 2023)


එසේම තම අනාගත වෘත්තීය ජීවිතයට කැළලක් සිදු වෙතැයි බිය නිසාම ශිෂ්‍යාවන් සහභාගි නොවේ. ආචාර්යවරුන්ගේ විරෝධය අනෙක් කරුණකි. සරසවි ආචාර්යවරුන් බොහොමයක් ශිෂ්‍යයන්ගේ ගැටලු වලට මානුෂීය නොවන බව ශිෂ්‍යයාවන්ගෙන් 12% පමණ ප්‍රකාශ කළෝය.

"කවුන්සිල් වැඩවලට යන්න ආසයි. ඒත් ඉතින් වැඩත් එක්ක යන්න වෙලාවක් නැති එක තමයි ප්‍රශ්නේ. එසයිමන්ට් ගොඩ ගැහිලා ඒ හින්දා කවුන්සිල් වැඩවලින් ටිකක් අයින් වුණා. ජූනියර්ස්ලා වැඩේ ඇදගෙන යනවා" (ප්‍රතිචාරී අදහස් අංක 01- නියැදි සමීක්ෂණය, 2023)

**ශිෂ්‍යයාවන්ගේ දේශපාලන සහාගීත්වය අවම වීමට හේතු**

ශිෂ්‍යයාවන්ගේ දේශපාලන සහාගීත්වය අවම වීමට හේතු ඔවුන් තුළින්ම ලබා ගැනීමට අපේක්ෂා කළ හෙයින් ඔවුන්ගේ අදහස් විමසා බලන ලදි. මෙම පර්යේෂණය සඳහා යොදාගත් ශිෂ්‍යයාවන් 80 දෙනාටම මෙම ගැටලුව යොමු කළ විට ඔවුන්ට පොදුවේ බලපාන කාරණා මෙන්ම පෞද්ගලිකව බලපාන කාරණා පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවිය. තවමත් ආසියානු කලාපයේ ජීවත් වන වැසියන් වශයෙන් අප තුළ සමාජ ප්‍රතිමාන දළුලා වැඩේ. එනිසාම ජීවිතේ සෑම මොහොතක්ම ගැහැණිය ගත කරන්නේ පිරිමියාට අවශ්‍ය ලෙසයි. එලෙස නොවන්නේ අතළොස්සක් පමණක් ව මෙම අධ්‍යයනය තුළ දී අනාවරණය කර ගත හැකි විය.

රූප සටහන 3: ශිෂ්‍යයාවන්ගේ දේශපාලන සහාගීත්වය අවම වීමට හේතු




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය. 2023*

තරුණ විය යනු ප්‍රේම සම්බන්ධතා සඳහා යොමු වන සාමාන්‍ය කාලයකි. සරසවිය පෙම්වතුන් බොහෝ විට ශිෂ්‍ය දේශපාලනය සඳහා යොමු වන්නේ නැත. බොහෝ විට පිරිමියා ගැහැණියට තහංචි දමයි. කැපි පෙනීම, බාහිර වැඩ කටයුතු සඳහා බොහෝ වෙලාවක් කැප කිරීම ආදී කටයුතු සඳහා පිරිමින් තමා පෙම්වතියට අවස්ථාව ලබා නොදේ. එය ඔවුන්ගේ තත්ත්වයට මදිපුංචිකමක් ලෙස සිතයි. ශිෂ්‍යාව සරසවිය තුළ ශිෂ්‍යයට වඩා ඉස්මතු වීම ශිෂ්‍යයාගෙ හිනමානයට පහරකි. සරසවි

ප්‍රේමය පමණක් නොව පිටස්තර ප්‍රේම සබඳතා පවත්වන අය ද තම පෙම්වතිය මෙම කාර්යයන්ගෙන්ඉවත් කර තැබීමට උත්සාහ කරයි.

අනෙක් කාරණාව ලෙස හඳුනා ගත හැක්කේ ශිෂ්‍යයාවකගේ කාර්යභාරය සුළු කොට තැකීමයි. පිරිමියෙක් ලෙසින් කාර්යශූර වන ගැහැනියක් දැකීම සමාජ ප්‍රතිමානයන් හා නොගැළපේ එනිසාම ගැහැනු කළ යුත්තේ ගැහැනු වැඩ පමණක් යැයි ඇතමුන් සිතන බව ඔවුන්ගේ අදහස් හරහා පැහැදිලි විය.

"අපි ගම්වලින් තමයි ආවේ එහෙමයි කියලා අපි පැත්තක ඉන්න ඕන නෑනේ කෙල්ලෝ දන්නේම තව කෙනෙක්ට කතාවක් හදන්න. තමන්ට බැරි සීමාව වෙන කෙනෙක් අතික්‍රමණය කළොත් එයාලට ඒ දරා ගන්න අමාරුයි" (ප්‍රතිචාරී අදහස් අංක 01- නියැදි සමීක්ෂණය, 2023)

මෙවැනි ප්‍රකාශ වලින් තහවුරු වන්නේ පොදු ජන ස්ත්‍රීවාදී සිතුවිලිය. මෙකී කාරණා පදනම් කරගනිමින් ශිෂ්‍යයාවන් ශිෂ්‍ය සංගම් ක්‍රියාකාරීත්වයෙන් හා ශිෂ්‍ය දේශපාලනයෙන් ඈත්ව සිටීමක් දැකගත හැකිය.

**නිගමනය**

විශ්වවිද්‍යාලය යනු සමාජය ඇතුලත තිබෙන උපසංස්කෘතික රාමුවකි. එකී උපසංස්කෘතිය තුළ වෙනම තලයක දිවයන ප්‍රස්තුතයක් ලෙස ශිෂ්‍ය දේශපාලනය හඳුන්වා දිය හැක. නීතිය කුඩාකළ පටන් දරුවෙකුට පාසල් පද්ධතිය තුළ උගන්වන්නේ නැති වුවද මහා සමාජයට පැමිණි පසු පුරවැසියන් සියලු දෙනාම තම යුතුකම් හා අයිතිවාසිකම් වෙනුවෙන් අවදිව සිටී. ශිෂ්‍ය දේශපාලනය හරහා ද සිදු කෙරන්නේ එවැනිම වූ කාර්යභාරයකි. මේ පිළිබඳව සමාජය තුළ පසුගාමී පිළිගැනීමක් තිබුණ ද සක්‍රීය දේශපාලන ගමන් මගක් සඳහා ශිෂ්‍ය දේශපාලනයෙන් හිමි වන්නේ අපරිමිත වූ සේවාවකි. මෙම අධ්‍යයනය තුළින් නිගමනය වූයේ ශිෂ්‍යයාවන් ශිෂ්‍ය දේශපාලනයට අවතීර්ණ වන්නට ඉතා මන්දගාමී ස්වාභාවයක් දක්වන බවයි. සරසවි ප්‍රවේශය සිදු වන්නේ ශිෂ්‍යයන්ගේ තරුණ වියේදි ය. ශ්‍රී ලංකාව තුළ බොහෝ විට රජයේ උසස් අධ්‍යාපනය ලබා ගන්නේ බොහෝ නිර්ධන පාන්තිකයින් ය. තම මව, පියා ගඩොල් කපන, තේ දළු නෙළන, දිනක අවම වැටුප පවා නොලබන පවුලකින් සරසවියට ප්‍රවේශ වන ශිෂ්‍යාවන් බොහෝ විට ශිෂ්‍ය දේශපාලනය පැමිණීමට මැලිකමක් දක්වන්නේ තම පවුල් පසුබිම තුළින් ඇතිකෙරෙන තෙරපුම නිසාය. අනෙක් අතට දේශපාලන පසුගාමිත්වය ඇති කෙරෙන තවත් ප්‍රබල සාධකයක් පවතී. එනම් බොහෝ දෙනා සමාජ ක්‍රමය තුළ ශිෂ්‍ය දේශපාලනයේ නිරත වන්නන් දෙස 88,89 කාලය තුළ බැලූ වපැරිසින් බලන්නට පුරුදු වී සිටීමයි. ශිෂ්‍යයන්ට සාපේක්ෂව බොහෝ විට ශිෂ්‍යාවන් තම ආත්ම ගෞරවය, පවුලේ නම්බුව ගැන සිතා මේ සඳහා යොමුනොවන බවත්. ආසියාතික සමාජයේ බොහෝ විට පුරුෂ මූලික සමාජ සංස්කෘතික රාමුවක් ගොඩ නැගී තිබෙන බව තවදුරටත් මේ හරහා තහවුරුවේ. පාසල් කාලයේ සිට ශිෂ්‍ය ශිෂ්‍යයාවගේ මනස සමාජ ප්‍රතිමාන කේන්ද්‍රකරගනිමින් සකස් වී තිබීම මෙයට බලපා ඇති අනෙක් සාධකයයි. උක්ත පර්යේෂණය හරහා සනාථ වන්නේ ශිෂ්‍යාව තුළ පවතින සමාජ ආකල්ප හා ප්‍රතිමාන හේතුවෙන් ඔවුන් තම ශිෂ්‍ය දේශපාලනයෙන් පසෙකට වී සිටීමට උත්සාහ කරන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අයිවන්, වී. (1979). 71 කැරල්ල. මහරගම. රාවය ප්‍රකාශකයෝ.

ප්‍රදීප්, ඒ. (2003) ග්‍රාමීය සමාජවාදයේ දේශපාලනය. ගණේමුල්ල. සාරංගා ප්‍රකාශකයෝ

ජයවර්ධන, ඒ. (2018) අධ්‍යාපන ප්‍රතිභා 10. මහරගම. නිව් ආසිරි ප්‍රින්ටර්ස්

ලියනගේ, කේ., වළාකුළුගේ, එස්. (2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය. කොළඹ. ෆෙඩ්රික් ඊබර්ට් පදනම

වික්‍රමරත්න, ඩී. (2006). ජවිපේ දෙවන කැරැල්ල. කතෘ ප්‍රකාශන

ශිවකුමාර්, කේ. (2021) ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි වෙනස්කොට සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ සැලකීමේ සමාජ ප්‍රතිමාන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා නිදහසට එයින් ඇතිවන බලපෑම. කොළඹ 08. ඩිරෙක්ට් ප්‍රින්ටර්ස්.

Abeykoon, D. (2020). Baseline Study for EU Funded Project-Women in Learning and Leadership. Colombo: Search for Common Ground.

Banargee, A. (2018). Exporting Students Politics.Manasi Baneejee 19.

Banu, A. (2016). Human Development, disparity and vulnerability: Women in South Asia, . New York: UNDP.

Cockburn, A. (1969). Student Power-Problems, Diagnosis,Action.Australia.Penguin

Emmerson, D. K. (Ed). (1968).Students and Politics in Developing Nations.London.Pall

Gunawardana, R. A. L. H. (2014). More Open Than Usual.University of Peradeniya 24. University of Surrey. Students Politics and Protest.United Kingdom. Rachel

Jayawardena, K. (1986). Feminism and Nationalism in the Third World 22.

Jayawardena, K. (2016). Emancipation and Subordination of Women in Sri Lanka. In K. Jayawardena, Feminism and Nationalism in the Third World (pp. 99-119). London: Verso

Nagel, J (edited). (1969). Student Power. London. Merlin press 23.

Samaranayake, G. (1992). Changing Patterns of Student politics in Sri Lanka.

T. Herath, & all, e. (2018). The effect of a community-based health promotion intervention to change gender norms among women in a rural community in Sri Lanka. Sri Lanka: BMC.

UNDP. (2019). Human Development Report 2019: Beyond averages, beyond today: Inequalities in human development in the 21st century. New York: UNDP.

UNDP. (2020). Beyond income, beyond averages, beyond today: Inequalities in human development in the 21st century. New York: UNDP.

Vithanage, D. S. (2015). Understanding the Nature and Scope of Patriarchy in Sri Lanka: How Does it Operate in the Institution of Marriage? Sri Lanka.